**Ministry of Education**
අධ්‍යාපන අමාත්‍යාංශය

"Isurupaya", Sri Jayawardhanapura Kotte, Battaramulla
"ඉසුරුපාය", ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බත්තරමුල්ල
Tele/දුරකථන: 2785141-50 Fax/ෆැක්ස්: 2784846 Email/ඊමේල්: isurupaya@moe.gov.lk Web/වෙබ්: www.moe.gov.lk

2009.01.01

**ප්‍රවෘත්ති නිවේදනයයි**

## අ.පො.ස. (උ.පෙළ) සඳහා ඉංග්‍රීසි අනිවාර්ය නොවේ.

2008 අ.පො.ස. (සා.පෙළ) නව විෂය නිර්දේශයට අනුව උසස් පෙළ සඳහා හර විෂයයන් සියලුම ශිෂ්‍යයන් විසින් හැදෑරිය යුතු අතර එම විෂයයන් 06 ට හා තෝරා ගන්නා වෙනත් විෂයයන් 03 කට පෙනී සිටිය යුතුය. මේ අනුව නව විෂය නිර්දේශය සඳහා 2008 වසරේ පළමු වරට අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටින සිසුන් හර විෂයයන් 06 ක් හා කාණ්ඩ විෂයයන් 03 කට (විෂයයන් 09 කට) පෙනී සිටිය හැකිය. එම හර විෂයයන් ගෙන් මාධ්‍ය භාෂාව හා ගණිතය ඇතුලුව විෂයයන් 06 කින් සමත් විය යුතු අතර එම විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයයන් 03 කට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අ.පො.ස. (උ.පෙළ) සඳහා වූ මූලික සුදුසුකම ලෙස පිළිගැනේ. අතිරේක විෂයයන්ගෙන් ලබා ගන්නා සාමාර්ථ හෝ සම්මාන සාමාර්ථ උසස් පෙළ සඳහා වූ සුදුසුකම් ලෙස යොදා ගත නොහැකිය. උසස් පෙළ සඳහා සුදුසුකම ලබා ගැනිමට අනිවාර්යයෙන්ම සමත් වී තිබිය යුතු විෂයයන් වන්නේ ගණිතය හා මාධ්‍ය භාෂාව පමණකි. උසස් පෙළ පන්තියට ඇතුලත්වීම සඳහා ඉංග්‍රීසි භාෂාව සමත්වීම අනිවාර්ය නොවන බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් නිමල් බණ්ඩාර මහතා අවධාරණයෙන් ප්‍රකාශ කරයි.

**මෙම ප්‍රවෘත්ති නිවේදනය ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරය කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.**

ජයවීර දෙල්පාගොඩ
මාධ්‍ය ලේකම්

ජයවීර දෙල්පාගොඩ
ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ
මාධ්‍ය ලේකම්
(සාම විනිසුරු)
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය", බත්තරමුල්ල

**MediaUnit**
Tele/දුරකථන: 2784869 Fax/ෆැක්ස්: 2784869 Email/ඊමේල්: mediaunitmoe@yahoo.com